# ඕස්ට්‍රේලියාවේ වේදිකා නාට්‍යය

**(පෙර කලාපයෙන්)**

පෙර ලිපියෙන් ද විස්තර කළ පරිදි, ලෝක යුද්ධ කාලය රංග කලාවට ගෙන ආවේ නිහැඬියාවකි. එහෙත්, ඒ පශ්චාත් යුද්ධ අතර කාල වකවානු, රංග නිර්මාණකරුවන්ව ආකල්පමය අතින් වෙනත් මානයකට ගෙනයන ලදී. පශ්චාත් යුද්ධ සමාජය පිනවීමට විනෝදාස්වාද රංග මෙන්ම, යුද්ධයෙන් වෙනස් වූ ජනයාගේ ජීවිතය පිළිබඳ සංකීර්ණ දැක්ම ද මෙම වකවානුවේ රංග නිර්මාණ උදෙසා ප්‍රස්තුත විය.

පුරුෂ පක්ෂයේ බහුතරයක් යුද්ධ පෙරමුණට යැවුණු විට, ආර්ථික සමාජීය ක්‍රියාවලිය මෙහෙයවීමට කාන්තාවන්ට සිදුවිය. කාන්තාවන්ගේ පෙරමුණ ගැනීම සාහිත්‍ය ලෝකයට ද යහපත් ව බලපාන ලදී සාහිත්‍යය මගින් කාන්තා දෘෂ්ටිකෝණයෙන් සමාජය අර්ථකථනය කිරීම ඇතිවන්නේ මෙකී පසුබිමක් හරහාය. එහෙත්, පුරුෂ ආධිපත්‍යයක් තිබුණ රංග කලා ක්ෂේත්‍රයේ එම නාට්‍ය රචනා කළ කතුන් ගැන සොයාගන්නට ඇත්තේ අසම්පූර්ණ සටහනකි. සාහිත්‍යය ක්‍රියාවලියේ නියුතු කතුන් අතරින් Betty Roland, Oriel Gray, Nancy Wills වැනි වෘත්තීය පෙළරචනා කළ අය විශේෂිත වන්නේ දේශපාලනික සහ සමාජීය විවරණයන්හි ඔවුනගේ තිබූ නව ප්‍රවණතාවය නිසාය. Betty Roland කාන්තා රචකයින්ගේ ආරම්භය සනිටුහන් කරන අතර ඇයගේ The Touch of Silk නාට්‍යය, පළමු ලෝක යුද්ධයේ දී ඕස්ට්‍රේලියානු සොල්දාදුවෙකු සමග විවාහ වූ ප්‍රංශ ජාතික කතක් ගැන වස්තුවිෂයය කරගත් රොමැන්තික වර්ගයේ රංගයකි. එහෙත් පසුව Betty දේශපාලන තේමා රැගත් නාට්‍ය රචනා කරන ලදී.

මෙම කාලවකවානුවේ ප්‍රධාන ධාරාවේ රංග සඳහා අබොරෝජිනල් ප්‍රස්තුතයන් සහ ආකෘතීන් යම් තරමකට යොදාගැනීමක් දක්නට ලැබේ. එහෙත් මෙම ආරම්භය සිදු කරණු ලබන්නේ අබෝරොජිනල් නොවන පුද්ගලයන්ගේ දායකත්වයක් සහ ඔවුනගේ දෘෂ්ටිකෝණය ඔස්සේය. Oriel Gray වැනි කාන්තා පෙළරචකයන් ද මෙකී කාර්යයෙහි ලා දායකත්වය සපයනු ලබයි. John Antill විසින් අබොරොජින්වරුන්ගේ සම්ප්‍රධායික රංග ක්‍රම, සංගීතය සමග බටහිර බැලේ සහ අනෙකුත් රංග ක්‍රමවේද අනුවර්තනයෙන් සිදුකළ *Corroboree* බැලේ රංගයී ඒ ආකාරයේ නව උත්සහයක් මෙන්ම නව ජාතික අනන්‍යතාවයක් ඇති කළ නිර්මාණයකි. එහෙත් එවන් වර්ගයේ නිර්මාණ සඳහා ප්‍රහල අනුගාමීත්වයක් ඇති නොවන්නේ, රංග ක්‍රියාවලියේ නියුක්තිකයන් මෙන්ම රංග ප්‍රේක්ෂකයා ද ප්‍රධානයෙන්ම සමන්විත වුයේ ඉංග්‍රීසි භාෂක ඇන්ග්ලෝ ඕස්ට්‍රේලියානුවන්ගෙන් සහ යුරෝපීයන්ගෙන් නිසාය. මුල්යුගයේ ඇබොරොජිනල් රචකයන් මුහුණ දුන් ගැටළුවක් වුයේ උසස් යැයි සම්මත ඉංග්‍රීසියෙන් නාට්‍ය රචනා



කොට ඉදිරිපත් නොවීම හෝ විචාරක අනුග්‍රහයක් නොලැබීම නිසාය. මේ ගැටලුව මගහැරවා ගනිමින් ඇබොරෝජිනල් පසුබිමක් සහිත වෘත්තීය මට්ටමේ රචකයින් ක්‍රමයෙන් බිහිවන්නේ 1960 දශකයේ සිටය. ඒ අතර Kevin Gilbert, Robert Merritt, Gerry Bostock, Jack Davis වැන්නවුන් සමකාලීන ඇබොරොජිනල් සමාජීය ජීවිතය පිලිබඳ නාට්‍ය ප්‍රධාන ධාරාවට එක් කිරීමේ පුරෝගාමීහු වෙති. එහෙත් ඇතැමෙක්, විශේෂයෙන්ම අබොරොජිනල් ප්‍රජා පිරිස්, එකී රචකයින්ගේ ඇතැම් නිර්මාණ සඳහා ඇන්ග්ලෝ ඕස්ට්‍රේලියානු අදහස් හි බලපෑම ඇතැයි චෝදනා කරනු ලබති.

මේ අතරෙහි ප්‍රධාන ධාරාව තම අනන්‍යතාවයකින් යුතු රංග පහසුකම් වර්ධනයෙහි ලා උත්සුක වෙයි. 1953 දී Union Theatre Repertory Company නමින් අරඹන ලදුව, පසු කලෙක Melbourne Theatre Company නම් වූ ඕස්ට්‍රේලියාවේ පැරණිතම වෘත්තීය රංග ශාලාව බොහෝ පෙළ රචකයින් සහ අධ්‍යක්ෂකවරුන් හට තම නිර්මාණ ඉදිරිපත් කිරීමට අත්වැලක් වන ලදී. 1954 දී The Australian Elizabethan Theatre Trust (AETT) නම් භාරය මගින් ඕස්ට්‍රේලියානු රංගය ඕස්ට්‍රේලියානුවන් උදෙසා යන සංකල්පය යටතේ ආරම්භ කරනු ලැබේ. AETT මගින් මෙන්ම, රාජ්‍ය ආධාරය ලබමින්, 60 දශකයේ ඕස්ට්‍රේලියාව පුරා බිහිවුණු Canberra Theatre Centre, the Sydney Opera House, Arts Centre Melbourne, the Adelaide Festival Centre, සහ the Queensland Performing Arts Centre වැනි ප්‍රධාන නගර මුලික ලාබ අපේක්ෂාව ම මුල් නොකරගත් රංග ශාලා පමණක් නොව Riverside Theatres Parramatta, Wagga Wagga Civic Theatre, the Frankston Arts Centre වැනි සාමාන්‍ය රංගශාලා, වාණිජ මෙන්ම පර්යේෂණාත්මක රංග සඳහා ද අවස්ථාව සලසන ලදී. Seymour, Vance Palmer, Patrick White, Alan Hopgood, Alexander Buzo, David Williamson වැනි පෙළරචක රංගවේදීන් බිහිවන්නේ මෙම පසුබිමෙනි.

මේ යුගයේ දී බිහිවී, ඕස්ට්‍රේලියානු සංකේතයක් බවට පත් වූ චරිතයක් සහ රූපණ වේදියෙකු සඳහන් කළ යුතුමය. Union Theatre Repertory Company හරහා ගමන ඇරඹූ Barry Humphries නම් පුරුෂ රූපණ වේදියා, ඕස්ට්‍රේලියානු සංකේතයක් බවට බවට පත්වූ Dame Edna Everage නම් කාන්තා චරිතය ගොඩනගන්නේ 1955 පමණ කාලයේ සිටය. වසර හැටකටත් වඩා වේදිකාවේද රූපවාහිනී වැඩසටහන් හිද දිවෙන මේ චරිතය, සාමාන්‍ය ඕස්ට්‍රේලියානු ගෘහනියයක් හාස්‍ය උත්පාදක රංග රීතියකින් ඉදිරිපත් කෙරෙන වන අතර, එම චරිතයට දම් පැහැයට හුරු කෙටි කොණ්ඩයකින්ද විශාල cat eye glasses වර්ගයේ උපැස් යුවළකින්ද පළදින බාහිර අනන්‍යතාවක් ඇත. 1958 රංග කලාව හැදෑරීම සඳහා ආරම්භ කරන ලද AETT අනුග්‍රහය යටතේ බිහිවුන National Institute of Dramatic Art වැනි ආයතන මගින් පසු කලෙක අධ්‍යාපනය ලැබූ Mel Gibson, Cate Blanchett, Toni Collette වැනි රූපණ වේදීහු ද ජාත්‍යන්තර තලයට පමිනියෝහු වෙති. මෙම රංග පාසලෙන් බිහිනොවූවත් Geoffrey Rush රූපණ වේදීයා ද සිහිපත් කළ යුත්තෙකි.

ප්‍රධාන ධාරාවට සමගාමීව, ඕස්ට්‍රේලියානු රංගකලාව ක්‍රමයෙන් නව ගමනක් අරඹන්නේ 1950 දශකයේ මැද භාගයේ සිටය. එයට ද හේතුව වන්නේ පශ්චාත් යුධ පරිසරයයි. 1901 සිට බලපැවැත්වූ සුදු ඕස්ට්‍රේලියානු ප්‍රතිපත්තිය මගින් උගත් ඉංග්‍රීසි මව් භාෂිකයන්ට සීමා වූ සංක්‍රමණ සීමා ව ලිහිල් වී යුද්ධයෙන් අවතැන් වූ පොදු රාජ්‍ය මණ්ඩලීය ඇතැමෙකුට ද අනෙකුත් යුරෝපීයන් හට ද ඕස්ට්‍රේලියාවට පැමිණීමට මෙකළ ඉඩ සැලසීම මෙහි ඇරඹුමයි. 1950 දශකයේ දී ඕස්ට්‍රේලියානුවන් සහ මෙහි වෙසෙන බ්‍රිතාන්‍යයන් විසින් කිරීමට මැළිවන කම්කරු රැකියා උදෙසා ගෙන්වන්නට සිදුවන බ්‍රිතාන්‍ය නොවන යුරෝපීයන් සහ විවධ ජාතීන් ගේ සංකෘතිමය මිශ්‍රණයෙන් ද ඕස්ට්‍රේලියාව බහු



සංස්කෘතික සමාජයකට මුල පුරනු ලබයි. දශක කිහිපයක් පුරා ඕස්ට්‍රේලියාව ලබනා පෝෂණය, ක්‍රමයෙන් නව සාහිත්‍ය සහ රංගකලාවක් බිහි කරනු ලබයි.

**මතු සම්බන්ධයි**

**(ක්‍රෝනිකල් ඔෆ් ඕස්ට්‍රේලියා හි වාර්තා, පැරණි පුවත්පත් වාර්තා සහ පර්යේෂණ මුලාශ්‍ර පදනම් ව ගවේෂණාත්මකව මෙම ලිපිය සම්පාදනය කරන ලදී)**



ආචාර්ය
තරංග දන්දෙණිය

---

# ගී සඳලුව

Gee... Sandaluwa



සිසිර දිසානායක

## රුක්මණී ගී සරණිය

තමන් විඳි අතීත රස යළි යළි විඳිමින් එහි ගැලීමට අතීත කාමය යැයි කියනු ලැබේ. අප වැඩි වශයෙන් ලොල් වන්නේ අතීතයේදී ඇසූ දුටු දේ අගැයීමටයි; අතීතාවර්ජනයේ යෙදෙමින් සතුටුවීමටයි. එය අනුන් සමඟ බෙදා හදා ගැනීමට නම් එම රසඥතාවයම ඇති, ඒදේම අගයන පිරිසක් අප හට හමු විය යුතුයි.



පසුගිය දා මෙල්බන් නුවර ග්ලෙන් වේවර්ලි ප්‍රදේශයේ පැවැත්වුණ "රුක්මණී ගී සරණිය" එවැනි සාර්ථක උත්සාහයකි. හෙළ සිනමා වංශ කථාවේ මුල්ම නිළිය වූ රුක්මණී දේවියගේ විශේෂත්වය වන්නේ ඇය රඟපෑමට පමණක් සීමා වූ නිළියක නොවීමයි. ඇය ගායනයෙන් ද සමත්කම් පෑවාය. රඟමින් ගැයුවාය; ගයමින් රැඟුවාය. එනයින් ඇයගේ හපන්කම් ඇසූ මෙන්ම දුටුවෝද අප අතර බොහෝ වෙත්.



ඉතාම හැඟුම් බරව, දක්ෂ ලෙස ගයමින් චරිතවලට අනුකූලව දක්ෂ ලෙස රඟමින් රසික ප්‍රේක්ෂක සිත් ඇඳ බැඳ ගත් රුක්මණී දේවිය, රූප ශ්‍රීයෙන් ද සියළු දෙනාගේ අවධානය තමන් වෙත රඳවා ගත්තාය. එනයින්, ගායිකාවකගේ, නිළියකගේ සහ රූමතියකගේ භූමිකාවන් තුනක්ම කලා ලොවේ රඳවාලමින් ඉතිරි කළ ප්‍රතිරූපයට ඉහළින් අද වන තුරු ද යමෙකු ඉස්මතු වී නොමැති බව පෙනී යයි. ඇය පරයා ගයන ගායිකාවන් සිටිය ද, රඟපාන නිළියන් වේද, ආකර්ෂනීය රූමතියන් වුවද මේ සියල්ල ගොනු වූ චරිතයක් මෙතෙක් බිහි වී නැති බවයි අපගේ අදහස. අනෙකුත් භූමිකාවන් කෙසේ වෙතත් ඇය ගැයූ ගායනා රසවිඳිනු වස් වේවර්ලි වැඩිහිටි සංගමය සංවිධානය කළ "රුක්මණී ගී සරණිය" පිරී ගිය ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සාර්ථකව පැවැත්විණ.

"රුක්මණී ගී සරණියේ " අදහස මෙන්ම නියමුවා වූයේ ජය ශ්‍රී චන්ද්‍රජිත් ප්‍රවීණ රංගන ශිල්පියායි. සජීවී සංගීත වාදනයට ඩී.ඩී. ගුණසේන (වයලින්) කැමරන් කොළඹගේ (ගිටාර්) නාලක වීරකෝන් (හාර්මෝනියම්) රෝහිත උඩවෙල (තබ්ලා) රංග වික්‍රමරත්න (බටනලාව) යන පිරිස එක් වූහ.

ශබ්ද පරිපාලනය ඉන්ද්‍රජිත් මිරිහාන ශිල්පියා අතින් සිදු වූ අතර ආලෝකකරණය සහ පරිගණක කටයුතු උපා උපදාස සහ ප්‍රියන්ත ප්‍රනාන්දු යන අයට භාර විය. වේදිකා සහ ශාලාලංකරණය අප හට භාර විය.

රුක්මණී දේවිය එදා ගැයූ ගී මෙම ප්‍රසංගයේ ගායනා කළේ නාලිකා අබේරත්න, පුෂ්පා තිසේරා, නිමේෂා ගමගේ, චමරි වීරකෝන්, වාසනා වීරකෝන්, හිරණ්‍යා මනෝරත්න, සෙව්වන්දිකා අබේරත්න, මිලන්කා චන්ද්‍රජිත් යන පිරිසයි. යුග ගායනයෙන් ඩී.ඩී. ගුණසේන, ජය ශ්‍රී චන්ද්‍රජිත්, කැමරන් කොළඹගේ, නාලක වීරකෝන්, හේමන්ත ඩයස් යන පිරිස ඔවුනට සහය වූහ.

ගැයූ ගී අතරට "සිරි බුද්ධ ගයා විහාරේ", " දුෂ්මන්ත අහෝ කිමදෝ", "දැඩිකල මාතා", "අද අඬනව හිමියනි", "ලස්සන රත්තරං බබෝ", "දල්වව් බැති ආදර පෙම්", "ආදරේ නිසා", "හද ගිලෙයි අම මිහිරේ", "පෙම් සිහින මවන", "මේ රාත්‍රියේ ආවෙමි", "මොනව හිතාගෙන", "දෙවා ගිනි", "මෝරනවා ප්‍රේමේ", "ආදරයයි කරුණාවයි", "මැවිලා පෙනේවි", "ආදර පාන සුදා", "මැණිකේ ඔබේ සිනාවේ", "තරු පායන ආකාසේ", "අන්න සුදෝ", "රාණී එන්කො", "දෙන්න ප්‍රියේ දෑතට ඔය දෑත", "ආදර නදිය ගලා", "පුන්සඳ හිනැහෙන්නේ", "මල්බර හිමිදිරියේ", "ගලා කන්දේනි මතු වෙනා" ගීත එක් විය.

මෙල්බන් නුවර වසර 40 කට වැඩි කාලයක් තිස්සේ ප්‍රජා කටයුතුවල කටයුතු කරනා උපා උපදාස මහත්මාත් ප්‍රිය බිරිඳ ස්වර්ණා උපදාස මහත්මියත් අගැයීමක්ද මෙම උත්සවයේදී සිදි වූ අතර ඉතා ප්‍රණීත සරළ රාත්‍රී භෝජනයක්ද පැමිණ සිටියවුනට සංග්‍රහ කෙරිණ.

**ආදරයයි කරුණාවයි**
**හිමි බැතියයි මා සිත පාරයි**
**සෝකේ උල්පත සංකා ගඟ වී**
**සංතාපයේ සාගරය සොයයි**

**දහසක් වටිනා මුතුහර කුමටද**
**සිතු සේ ගෙල පළඳන්න බැරි ?**
**හද බැති නංවන පුදසුන කුමටද**
**සිතු සේ ඉන් ජය ගන්න බැරි ?**

**මගෙ හිමියටයි පිදු ආලයටයි**
**කොහොමද එකවර හිත දෙන්නේ ?**
**නොයිඳුල් පෙම හා හිමි බැති සටනින්**
**ඉරණම කෙළෙසද විසඳෙන්නේ ?**

දෛවයෝගය (1959) චිත්‍රපටයෙන්
රචනය : සරත් විමලවීර
සංගීතය: සජාබ් හුසේන්
ගායනය : රුක්මනී දේවි